# දීඝනිකායේ කාල නිර්ණය පිළිබඳ විමර්ශනයක්

- පනාමුරේ චන්දිම හිමි

## ප්‍රවේශය

බුදුරජාණන් වහන්සේ දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය විසින් ''පිටක'' යන පොදු නාමයෙන් කොටස් තුනකට බෙදා දක්වා ඇත. එනම්,

- සූත්‍ර පිටකය
- විනය පිටකය
- අභිධර්ම පිටකය

වශයෙනි. මෙම කොටස් තුනම එක් අවස්ථාවකදී හෝ එක් යුගයකදී ඇතිවූවා යැයි පැවසිය නොහැකිය. කාලාන්තරයක් තිස්සේ ගොඩ නැගුණු සාහිත්‍යයකි බෞද්ධ සාහිත්‍යය. ඕනෑම ආගමික සාහිත්‍යයක් කල් යෑමේදී විවිධ වෙනස්කම් වලට භාජනය වීම අරුමයක් නොවේ. සූත්‍ර පිටකාගත දීඝනිකායේ එබඳු සංවර්ධනීය කොටස් තිබේද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණයි. සූත්‍ර පිටකය හා එහි එන දීඝ නිකායේ අන්තර්ගතය පිළිබඳව ද අධ්‍යනය කිරීමට අදහස් කරමි. ඒ තුළින් එම සූත්‍රයන්හි කාලය පිළිබඳ නිර්ණය කිරීමට අපේක්ෂිතය. මෙහිදී ''පිටක'' යනු කුමක් ද යන්න අටුවාචාරීන් වහන්සේලා විස්තර කර ඇත්තේ මෙසේය.

''පිටකං පිටකත්ථ විදූ
පරියත්තිභාජනත්තතො
අහු තෙන සමොධානෙත්වා
තයොපි විනයාදයො ඤෙයො'' [1]

23 JUL 2019

මෙහි සඳහන් ආකාරයට "පිටක" යන්න විශේෂ අර්ථ දෙකක යොදා ඇත. "පර්යාප්ති" හෙවත් කටපාඩමින් මතකයේ රඳවා ගැනීම හා ධාරණ වශයෙන් ප්‍රගුණ කිරීම, භාජනය කිරීම එම අර්ථද්වයයි. භාජනයට හෙවත් කූඩයට ඕනෑම දෙයක් දැමිය හැකිවාක් මෙන් ධාරණය කරගත් දෙය ඒ ඒ අර්ථයන්හි දැමිය හැකිය යන්න මෙහි අදහසයි. ඒ අනුව සූත්‍රයන්හි ඇති සියලු දෑ එක්කොට සූත්‍ර පිටකය ද, විනයෙහි ඇති සියලු දෑ එක්කොට විනය පිටකය ද, අභිධර්මයෙහි ඇති සියලු දෑ එක්කොට අභිධර්ම පිටකය ද වශයෙන් වෙන් කොට දක්වා ඇත.

පාලි ත්‍රිපිටකය එක් යුගයක දී බිහි වූවක් නොවන අතර එහි මූලාරම්භය බුදුරජාණන් වහන්සේගෙන් සිදු වූ අතර තවත් කොටසක් සැරියුත් මුගලන් ආදී මහා ශ්‍රාවකයන් වහන්සේලාගෙන් ද, තවත් කොටසක් සංගීති කාරක තෙරවරුන්ගෙන් ද සම්පූර්ණ වූ බව පැහැදිලි වෙයි. පන්සාළිස් වසක් මුළුල්ලේ දේශනා කරන ලද ධර්මය මුල් කාලය තුළ දී විවිධ නම් වලින් ද හඳුන්වා ඇත.

බුදු දහම, බුද්ධ වචනය, බුද්ධ ධර්මය, ධම්ම, බ්‍රහ්මචරිය, සහිත, සද්ධම්ම, ධම්මචක්ක, පාවචන, සාසන, පාලි. යන පදයන් බුද්ධ වචනය හැඳින්වීම සඳහා යොදාගෙන ඇත. අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමියෝ ත්‍රිපිටකය විවිධාකාරයෙන් වර්ග කළෝය.

"තදෙතං සබ්බංපි බුද්ධවචනං රස වසෙන එකවිධං

ධම්ම විනය වසෙන දුවිධං පඨම මජ්ඣිම පච්ඡිම වසෙන තිවිධං

තථා පිටක වසෙන පංචවිධං අංග වසෙන නවවිධං ධම්මක්ඛන්ධ වසෙන චතුරාසීති සහස්ස විදන්ති වෙදිතබ්බං"[2]

මේ අනුව සමස්ත බුද්ධ වචනය රස වශයෙන් ඒකවිධ වන බවත්, ධර්ම විනය වශයෙන් ද්විවිධ වන බවත්, පඨම, මජ්ඣිම, පශ්චිම වශයෙන් ත්‍රිවිධ වන බවත් දක්වා ඇත. එසේම බුද්ධ වචනය



නිකාය වශයෙන් පස් වැදෑරුම් වන බව ද දක්වා ඇත. එහෙත් මෙහි දී අවධාරණය කළ යුතු වන්නේ මෙම නිකාය පස තුළ අන්තර්ගත වී ඇත්තේ බුද්ධ දේශනාවෙන් කොටසක් බවයි. මෙම වර්ගීකරණය කිරීමේ පදනම විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ දීර්ඝ සූත්‍ර අන්තර්ගත කොටස දීඝ නිකාය ලෙසත්, මධ්‍යම ප්‍රමාණයේ සූත්‍ර අන්තර්ගත කොටස මජ්ඣිම නිකාය ලෙසත් දක්වා ඇති බවයි. සූත්‍රයන්ගේ විශාලත්වය පදනම් කොටගෙන මෙම වර්ගීකරණය සිදු කළේ නම් ඊළඟට ඇතුළත් විය යුතු වන්නේ ඛුද්දක නිකායයි. එහෙත් සංයුක්ත හා අංගුත්තර නිකායන් බිහි වීමට බලපෑ හේතු සාධක විමසා බැලීම වැදගත් වෙයි. එකී කාරණය මේ අයුරින් උපකල්පනය කළ හැකිය.

ආරම්භයේ දී සූත්‍ර පිටකය නිකාය තුනක් වශයෙන් පවතින්නට ඇත. එනම් දීඝ නිකාය, මජ්ඣිම නිකාය, ඛුද්දක නිකාය වශයෙනි. දීර්ඝ ප්‍රමාණයේ සූත්‍ර තිස් හතරක් අන්තර්ගත දීඝ නිකායත්, මධ්‍යම ප්‍රමාණයේ සූත්‍ර එකසිය පනස් දෙකක් අන්තර්ගත මජ්ඣිම නිකායත් හැරුණු කොට දැනට සංයුක්ත, අංගුත්තර හා ඛුද්දක නිකායන්හි අන්තර්ගත කෙටි සූත්‍ර ඇතුළත් ධර්මය ඛුද්දක නිකායේ සංග්‍රහ වී පවතින්නට ඇත. සෙසු නිකායන් දෙක හා සන්සන්දනය කිරීමේ දී ඛුද්දක නිකාය ඉතා විශාල ග්‍රන්ථයක් වූ හෙයින් සංගීති කාරක භික්ෂූන් වහන්සේලා විසින් ඛුද්දක නිකායේ ධර්ම කරුණු පිළිබඳ කරන ලද පරීක්ෂණයක ප්‍රතිඵලයක් වශයෙන් එය නාම හා ගෝත්‍ර අන්තර්ගත සූත්‍ර අංක අනුපිළිවෙළින් සංග්‍රහ කළ හැකි සූත්‍ර ලෙස දෙකොටසකට බෙදන්නට ඇත. එම දෙකොටස නම් සංයුක්ත හා අංගුත්තර නිකායන් ය.

මෙහි අනිවාර්ය ප්‍රතිඵලයක් ලෙස ඛුද්දක නිකාය නාමයට පමණක් සීමා වූ අතර එහිදී නැවතත් ඛුද්දක නිකාය ගොඩනගන ලදි. ඒ අනුව සූත්‍ර පිටකයේ විවිධ තැන්වලින් වැදගත් සූත්‍ර එකතු කොට ධර්ම සංග්‍රහ ලෙසින් තැබීම හා අලුතින් ධර්ම ග්‍රන්ථ සකස් වීම ද සිදු විය. බුද්ධ වංශය හා අපදාන පාලි යන ග්‍රන්ථ එසේ නව ධර්ම ග්‍රන්ථයන්ට උදාහරණයි. පේඨකෝපදේශ, මිළින්ද ප්‍රශ්න, නෙත්තිප්පකරණය යන ඒවා ද ඇතැමෙක් ඛුද්දක නිකායෙහි ලා සලකති. මේ ආකාරයට නව ග්‍රන්ථ සම්පාදනය හඳුන්වා දෙමින් හා

පැවති ග්‍රන්ථ සංස්කරණය කරමින් ද අද පවත්නා තත්වයට සූත්‍ර පිටකය විවිධ අදියරයන් යටතේ සංවර්ධනය වූ බව පෙන්වා දිය හැකිය. එහෙත් සංගීති වාර්තා ප්‍රකාශ කරන්නේ,

''එතෙනෙව උපායෙන පංචපි නිකායෙ පුච්ඡි''[3]

යනුවෙනි.

මෙම ප්‍රකාශයෙන් කියවෙන්නේ ප්‍රථම ධර්ම සංගායනාවේ දී ක්‍රම ක්‍රමයෙන් පස් නිකායම සංගායනා කළ බවයි. මෙම ප්‍රකාශය සූත්‍ර පිටකය සංවර්ධනය වීමෙන් අනතුරුව එක් කරන ලද වාර්තාවක් බව බොහෝ විචාරකයන්ගේ අදහසයි. එසේම අසූහාරදහසක් පමණ වූ ධර්මස්ඛන්ධය අතරින් දෙදහසක් භික්ෂූන් වහන්සේලාගේ යැයි පිළිගෙන ඇත.

ඒ බව,

''ද්වාසීතිං බුද්ධතො ගණ්හිං
ද්වෙසහස්සානි භික්ඛුනො
චතුරාසීති සහස්සානි
යෙ මෙ ධම්මා පවත්තිනොති''[4]

මෙම සඳහන තුළින් ශ්‍රාවක භාෂිතයන්ට ඓතිහාසික බවක් ලැබී ඇත.

සූත්‍ර යනු කුමක් ද යන්න පිළිබඳ විමසීම මෙහිදී වැදගත් වේ. ''සුත්ත'' යන පාලි වචනයේ සංස්කෘත රූපය ''සූත්‍ර'' බව පැහැදිලිය. සූත්‍ර පිටකයේ බොහෝ තැන්වල ''සුත්ත'' යන්න භාවිත වී ඇති අතර මුල්කාලයේ එය බුද්ධ දේශනාවන් හැඳින්වීම සඳහා යොදාගත් බවක් දැකිය නොහැකිය. ඇතැම් අවස්ථාවල දී බුද්ධ දේශනාවේ කොටසක් හැඳින්වීම සඳහා මෙම වදන භාවිත කොට ඇත.

''සුත්තන්තං අභිධම්මං ච විනයං චාපි කෙවලං
නවංගං බුද්ධ වචනං එත්ථධම්ම සභා තව''[5]



මෙහිදී අභිධම්ම, විනය සංඛ්‍යාත බුද්ධ වචනය ගැන කියවෙයි. ත්‍රිපිටක බුද්ධ වචනය තුළම එන මහා පරිනිබ්බාණ සූත්‍රයේ දී ''සුත්ත'' යන පදය භාවිත වී ඇත.

''සුත්තෙ වා ඔතාරෙතබ්බාති විනයෙ වා
සන්දස්සේතබ්බාති''[6]

සතර මහාපදේශ ගැන විස්තරයේ දී කිසියම් භාෂිතයක් බුද්ධ භාෂිතදැයි හඳුනා ගැනීමට සූත්‍රයන්හි බහා බැලීමටත්, විනයෙහි සැසඳීමටත් උපදෙස් දී ඇත. අටුවාචාරීන් වහන්සේලා ද ''සුත්ත'' යන වචනය විවිධාකාරයෙන් විග්‍රහ කර ඇත.

සුවුත්තො = සු + වුත්ත - මනාව ප්‍රකාශ කළ
සුදත්තො = සුද් + ත = සුත්ත - වැගිරීම

(දෙනගෙන් කිරි වැගිරෙන්නාක් මෙන් සූත්‍රවලින් අර්ථ - ධර්ම වැගිරෙන බැවින් සුත්ත යන නාමයෙන් ද)


සුත්තානා = සු + තාන = තා = සුත්ත - මනාව ආරක්ෂා කිරීම

සුත්තාසභාගතො = (නූලක් බඳු හෙයින්) නූලෙන් එකට ගොතන ලද මල් විසිරී නොයන්නාක් මෙන් සූත්‍ර හා බැඳුණු ධර්මයන් නොවිසිරී පැතිර පවත්නේය.[7]

වශයෙන් මෙම අර්ථ ලද සූත්‍ර පිටකයට ප්‍රධාන ග්‍රන්ථ 19 ක් ඇතුළත් වෙයි. මෙහි ප්‍රධාන වශයෙන් යැයි සඳහන් කරන ලද්දේ චීන බුරුම වැනි සම්ප්‍රදායවල සූත්‍ර පිටකයේ ග්‍රන්ථ ප්‍රමාණය මීට වඩා අධික බැවිණි.

සූත්‍ර පිටකයේ එන බොහෝමයක් සූත්‍ර ආරම්භ වන්නේ ''එවං මෙ සුතං'' යනුවෙනි. මෙය දුතියා විභක්ති වාක්‍ය ප්‍රයෝගයකි. එනම් 'අච්චන්ත සංයෝගයයි.' එය සිංහලයේ දී අත්‍යන්ත සංයෝගයයි. මෙහි දී සිදු වන්නේ ජාති, ද්‍රව්‍ය, ගුණ, ක්‍රියා, සංඥා සමග කාලය එකතු වීමයි. මෙම දේශනාවන් සමග

බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය ඇති වූ අතර එනිසා මෙහි ආරම්භය ද්‍රුතියා විභක්තියෙන් යොදා ඇති අයුරු අවබෝධ කරගත හැකිය. ''එවං මෙ සුතං'' යන පද තුන විවිධාර්ථවල යෙදෙන අයුරු අවබෝධ කරගත හැකිය. ඒ අනුව 'එවං' යන්නට අර්ථ තුනක් ඇති අයුරු පෙනේ.




අන්තර්ගතය

සූත්‍ර පිටකයේ එන මුල්ම නිකාය ග්‍රන්ථය වන්නේ දීඝ නිකායයි. ප්‍රමාණයෙන් දීර්ඝතම සූත්‍රයන්ගෙන් යුක්ත නිසා මේ ග්‍රන්ථයට මේ නම ලැබී ඇත. දීඝ නිකායේ ස්වභාවය දක්වා ඇත්තේ මෙසේය.

''දීඝස්ස දීඝසුත්තංකිතස්ස - නිපුණස්ස ආගමවරස්ස
බුද්ධානුබුද්ධසංවණ්ණිතස්ස - සද්ධාවහගුණස්ස''[8]

දීර්ඝ සූත්‍රවලින් යුක්ත වීම, සියුම් ගතියෙන් යුක්ත වීම, ආගම යන නම ලැබීම, බුදුවරුන් හා අනුබුදුවරුන් වර්ණනා කර තිබීම, ශ්‍රද්ධාව වර්ධනය කරවීම ආදිය නිසා එම නමින් වහරනු ලබයි. මෙම අදහස රීස් ඩේවිඩ් හා කාපෙන්ටර් (Rhys Devids and Carpenter) යන අපරදිග විද්වතුන් ද සනාථ කර ඇත.[9] ඔටෝ



ප්‍රාන්ක් (Outo Frank) නම් විචාරකයාගේ අදහසට අනුව දීඝ නිකාය යනු පැරණිතම සූත්‍රයන්ගේ එකතුවකි. එසේම එය සම ජාතීන් එකතු වී කරන ලද සූත්‍ර සංග්‍රහයක් බව ද ඔහු පවසයි.[10] එහෙත් මෙම අදහස බොහෝ විචාරකයන්ගේ විවේචනයට ලක් වී ඇත. රීස් ඩේවිඩ් මහතා මෙන්ම ඕල්ඩන් බර්ග් (Olden Berg) මහතා ද ඒ අතර වෙති.[11] විල්හෙල්ම් ගයිගර් මහතා ද එම අදහස දැඩිව ප්‍රතික්ෂේප කරයි.[12] දීඝ නිකායට ඉංග්‍රීසි පරිවර්තන බොහෝ ප්‍රමාණයක් වෙයි. ඒ අතර,

- The Digha Nikaya, edit, Rhys Devids and Carpenter, I, ii, iii, vol. London, pts, 1890
- The Digha Nikaya, translation by T.W.Phys and C.A.F.Rhys Devids
- Dialogs of The Gothama Buddhas. part 1,3,K.R. Nouman, Reborn

මෙම ඉංග්‍රීසි පරිවර්තනවලට අමතරව දීඝ නිකාය සම්බන්ධව පළ වී ඇති වාර්තා බොහෝය.

මෙම නිකාය තුළ ඇති සූත්‍ර ප්‍රමාණය 34 කි. ඒවා කොටස් තුනකට බෙදා දක්වා ඇත. එනම්,

- සීලක්ඛන්ධ වග්ගය - 13
- මහා වග්ගය - 10
- පාථික වග්ගය - 11[1]

හැකිතාක් දුරට සමාන නැතහොත් එකිනෙකට සම්බන්ධතාවක් ඇති කරුණු එක් ගොඩකට ගැනීමට සංගීති කාරක මහරහතන් වහන්සේලා උත්සාහ ගෙන ඇත.[13] එසේ වුව ද එම උත්සාහය සාකල්‍යයෙන්ම සම්පූර්ණ වී ඇති බව පැවසිය නොහැකි ය. පළමුවෙන්ම සංගායනා කොට පිළියෙළ කරගන්නා ලද්දේ පළමු ධර්ම සංගායනාවේ දී ය. එහිදී එය කටපාඩමින් පවත්වාගෙන යෑමේ භාරදූර කාර්යය, වගකීම පැවරුණේ සංගායනාවේ ප්‍රධානත්වයක් ඉසිලූ ධර්ම භාණ්ඩාගාරික ආනන්ද

මහ රහතන් වහන්සේට ය. එතැන් සිට එම පරම්පරාව දීඝ භාණක ආචාර්ය පරම්පරාව යන නාමයෙන් ප්‍රසිද්ධ විය. වර්තමාන ව්‍යවහාරයේ පවතින දීඝ නිකාය ප්‍රථම සංගායනාවේ දී සංග්‍රහ කරන ලද දීඝ නිකායම ද යන්න ඍජුවම පිළිගත නොහැකිය. මහාචාර්ය පී.වී.බාපට් (pro- P.V.Bapapt) මහතා පවසන්නේ දීඝ නිකාය යුග කිහිපයක දී සංස්කරණයට භාජනය වූ කෘතියක් බවයි.[14]

දීඝ නිකාය වර්තමානයේ පවත්නා ආකාරය අනුව කොටස් තුනකින් යුක්තය. එම වර්ග තුනට අයත් සූත්‍ර ප්‍රමාණයන් හා තොරතුරු ඉදිරිපත් කරන ආකාරය එකිනෙකට වෙනස්ය. එක් යුගයකදී සංවර්ධනය වූ කෘතියක් නොවේය යන්නට එයද නිදසුනකි. දීඝ නිකායේ පළමු වර්ගයේ ප්‍රධාන වශයෙන් භික්ෂු ශීලය පිළිබඳ කරුණු දක්වා ඇත. 'සීලක්ඛන්ධ' යන නාමය ලැබී ඇත්තේ ද එනිසාම ය. මෙහි පළමු සූත්‍රය බ්‍රහ්මජාල සූත්‍රයයි. ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ තිබූ ආගමික පසුබිම දෙසැටක් දර්ශනවාද හා ඊට ප්‍රතිපක්ෂව බුදුරජාණන් වහන්සේ ඉදිරිපත් කළ ත්‍රිවිධ ශීලයන් හා පටිච්ච සමුප්පාද ධර්මයන් මෙහි ප්‍රධාන තේමාව වී ඇත.

දෙවන සූත්‍රය සාමඤ්ඤඵල සූත්‍රයයි. මෙහිදී එකල භාරතයේ ව්‍යාප්තව පැවති ශාස්තෘන්ගේ දර්ශන හා ඔවුන්ගේ විමුක්ති මාර්ගික ඉගැන්වීම් විවේචනයට ලක් කර ඇත. බෞද්ධ ඉගැන්වීම්වල ඇති තර්කානුකූල බව ද එහි ඇති සාන්දෘෂ්ටික බව ද පෙන්වා දී ඇත. මීට අමතරව තවත් සූත්‍ර එකොළසක් මෙම වර්ගයේ ඇතුළත් වී ඇත. එනම්,

- අම්බට්ඨ සූත්‍රය
- සෝණදණ්ඩ සූත්‍රය
- කූටදන්ත සූත්‍රය
- මහාලි සූත්‍රය
- ජාලිය සූත්‍රය
- මහාසීහනාද සූත්‍රය
- පොට්ඨපාද සූත්‍රය
- ශුභ සූත්‍රය



- කෙවට්ඨ සූත්‍රය
- ලෝහිච්ච සූත්‍රය
- තෙවිජ්ජ සූත්‍රය

යන සූත්‍රයන්ය.

සෑම සූත්‍රයකම පොදු එක් ලක්ෂණයක් නම් එකල භාරතයේ ප්‍රසිද්ධව පැවති ආගමිකයන්ගේ විශේෂයෙන් බ්‍රාහ්මණයින්ගේ ආගමික මතවාද විවේචනය කිරීමයි. වර්ණ ධර්ම, ආශ්‍රම ධර්ම, ස්ව ධර්ම, ආපද් ධර්ම ආදී බ්‍රාහ්මණ ධර්ම නිසා හටගත් සමාජ අසාධාරණය මෙම සූත්‍ර මගින් දැඩි විවේචනයට ලක් කරයි. ඒවා ප්‍රතික්ෂේප කිරීම පමණක් නොව වඩා විශ්වාසදායී සියල්ලන්ටම පිළිගත හැකි සමාජ ධර්ම අම්බට්ඨ, සෝණදණ්ඩ වැනි සූත්‍රවලින් ඉදිරිපත් කොට ඇත. මිනිසෙකුගේ උස් පහත් බව මැනිය යුත්තේ කුලය පදනම් කොටගෙන නොව චර්යාව පදනම් කොටගෙන බව මේවායේ දී පෙන්වා දී ඇත. බෞද්ධ ආර්ථික දර්ශනය පිළිබඳ අදහස් කූටදන්ත වැනි සූත්‍රවලින් හෙළි වේ. ඍද්ධි බලය ලබා ගැනීම සඳහා ධ්‍යාන වැඩීමේ ඇති නිෂ්ඵලභාවය මහාලී සූත්‍රයේ දී පෙන්වා දී ඇත. මහාසීහනාද සූත්‍රය තුළින් අත්තකිලමතානුයෝගයේ ඇති නිෂ්ඵලභාවය විවේචනාත්මකව පෙන්වා දී ඇත. ජීවයත් ශරීරයත් එකකැයි හෝ දෙකකැයි බුදුදහම දේශනා නොකරන බවත් බුදුදහම මධ්‍යම ප්‍රතිපදාව පදනම් කොට ඇති බවත් ජාලිය සූත්‍රය දක්වා ඇත. ත්‍රිවිධ ශික්ෂාව පිළිබඳ විස්තර හා බුදුරජාණන් වහන්සේ වදාළ නොවදාළ දේ පිළිබඳ පොට්ඨපාද සූත්‍රයෙන් කරුණු දක්වයි. බුදු සසුනේ උගන්වන ආර්ය ශීලය, සමාධිය හා ප්‍රඥාව පිළිබඳ විස්තරය ද ඊට ඇතුළත් ය. චෝදනාවට ලක් විය යුතු හා ප්‍රශංසා ලැබිය යුතු ශාස්තෘන් පිළිබඳ දක්වා ඇත්තේ ලෝහිච්ච සූත්‍රයේ දී ය. මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂා යන සතර බ්‍රහ්ම විහරණ වර්ධනය කිරීමෙන් බ්‍රහ්ම තත්ත්වයට පත්විය හැකි බව තේවිජ්ජ සූත්‍රයේ දී දක්වා ඇත. මේ ආකාරයට සීලක්ඛන්ධ වග්ගයේ සූත්‍ර පෙළගස්වා ඇත.

මෙම සූත්‍රයන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ද දීඝ නිකායේ කාල නිර්ණය පිළිබඳ යම් අදහසක් අනුමාන කළ හැකිය. විශේෂයෙන්ම මෙම සූත්‍රයන්හි අන්තර්ගත භාෂා ලක්ෂණ බුද්ධ

කාලීන නොවන බවට ඉදිරිපත් කළ හැකි සාධක බොහෝය. ඇතැම් සූත්‍රයන්හි දෘෂ්ටිවාද පිළිබඳ සඳහන් වන අතර එහිදී දෘෂ්ටි ඉදිරිපත් කරන ලද ශාස්තෘන් වහන්සේලා දැඩි විවේචනයට ලක්කර තිබෙන ආකාරය දැකිය හැකිය.

දීඝ නිකායේ ඇතුළත් දෙවන වග්ගය වන්නේ මහාවග්ගයයි. මෙම නම යෙදීමට හේතු වී ඇත්තේ මෙහි එන සූත්‍ර දහයෙන් හතක්ම මහා යන විශේෂණයෙන් හැඳින්වෙන නිසා විය යුතුය. එමෙන්ම දීඝ නිකායේ දීර්ඝතම සූත්‍ර ඇතුළත් වන්නේ ද මෙම වග්ගයේ ය.

- ➢ මහාපදාන සූත්‍රය
- ➢ මහානිදාන සූත්‍රය
- ➢ මහාපරිනිබ්බාණ සූත්‍රය
- ➢ මහාසුදස්සන සූත්‍රය
- ➢ ජනවසභ සූත්‍රය
- ➢ මහාගෝවින්ද සූත්‍රය
- ➢ මහාසමය සූත්‍රය
- ➢ සක්කපඤ්ඤ සූත්‍රය
- ➢ මහාසතිපට්ඨාන සූත්‍රය
- ➢ පායාසිරාජඤ්ඤ සූත්‍රය

මහාපදාන සූත්‍රය සමස්ත ත්‍රිපිටකයේ ම එන දීර්ඝතම සූත්‍රයයි. එහි බණවර එකසිය විසි හයක් ඇත. මෙය 'සුත්තංතරාජ'[15] යන නාමයෙන් ද හඳුන්වනු ලබයි. මෙහි ඇතුළත් වී ඇත්තේ විපස්සි, සිඛී, වෙස්සභූ, කකුසඳ, කස්සප, කෝණාගම, ගෝතම යන බුදුරජාණන් වහන්සේලා පිළිබඳ තොරතුරුය. එසේම උන්වහන්සේලා දේශනා කරන ලද පටිච්චසමුප්පාද ධර්මය ද මෙහි ඇතුළත් වෙයි. මහාපදාන සූත්‍රයේදී මේ ආකාරයට අතීත බුදුවරුන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කොට එම බුදුවරුන් හා ගෞතම බුදුන් වහන්සේ ද සමාන කොට දක්වා අතීත බුදුවරු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම බුද්ධ සංකල්පයේ දියුණු අවස්ථාවක සිදු වන්නට ඇති බව සිතිය හැකිය. තවද මෙහි බෝධි සත්ත්ව යන වචනයද දැකිය හැකිය. එම අදහස ද බෝධි සත්ත්ව සංකල්පය පිළිබඳ යම් කතිකාවතක් තිබූ යුගයක එකතු වන්නට ඇතැයි සිතිය හැකිය.



මේ ආකාරයේම ගැඹුරු ධර්ම කරුණුවලින් යුක්ත දේශනයකි මහානිධාන සූත්‍රය. පටිච්චසමුප්පාදයේ ගැඹුරු බව හා එය අවබෝධ කර නොගැනීම නිසා සත්ත්වයන් සසර සැරිසරන බව ද නාම රූප හා විඥාන එකිනෙකට හේතුප්‍රත්‍යව පවත්නා තාක් උපත, ජරාව හා මරණය ආදී සසර දුක් ඇතිවන බවත් මෙහි දී පෙන්වා දී ඇත. මෙහි ඇති විශේෂත්වය වන්නේ පටිච්ච සමුප්පාදයේ අංග දහයක් පමණක් මෙහි ඇතුළත් වී තිබීමයි. අවිජ්ජා සංඛාර යන අංග දෙක මෙහි එන පටිච්ච සමුප්පාදයට ඇතුළත් වී නැත. මෙය සැලකිය යුතු අදහසකි. තර්කානුකූලව ඉහත අංග දෙක ඉවත් කළේද එසේ නොමැති නම් ඒ වන විට පටිච්චසමුප්පාදයේ අංග සියල්ල සම්පූර්ණ නොවී තිබුනේද යන්න විමසා බැලිය යුතුය. කෙසේ වුවද මෙම සූත්‍රය ද පසුකාලීන ලක්ෂණ පෙන්නුම් කරන බව පෙන්වා දිය හැකිය.

දීඝනිකාය තුළ අන්තර්ගත බොහෝ දෙනාගේ ආධානයට ලක් වූ දේශනයක් වන්නේ මහාපරිනිබ්බාණ සූත්‍රයයි. බුදුරජාණන් වහන්සේගේ ජීවිතයේ අවසාන සමය මෙන්ම එහි ඓතිහාසිකත්වය ද මෙම සූත්‍රයේ ඇතුළත් ය. සැදැහැවතුන් විසින් සංවේග දැනවිය යුතු ස්ථාන සතරක්, සංඝයා කැමති නම් ඛුද්දානුඛුද්දක ශික්ෂාපද වෙනස් කරගත හැකි බවත්, බුදුන් වහන්සේගේ අන්තිම බුද්ධ වචනයත් මෙහි ඇතුළත් වේ. මෙම සූත්‍රයේ ඇතුළත් බොහෝ පාඨ ත්‍රිපිටකයේ වෙනත් තැන්වල ඇතුළත් වන බව මහාචාර්ය රීස් ඩේවිඩ් මහතා ද ප්‍රකාශ කරයි. මෙම සූත්‍රය වසර ගණනාවක් තුළ සංවර්ධනය වන්නට ඇතැයි අන්තර්ගත කරුණු අධ්‍යයනයෙන් මනාව අවබෝධ කරගත හැකිය.

මහා සුදස්සන නම් සක්විති රජු පිළිබඳ සියලු සංස්කාර ධර්මයන්ගේ අනිත්‍ය බවත් මහාසුදස්සන සූත්‍රය විග්‍රහ කරයි. විවිධ භෞතික වස්තූන් අති උත්කර්ෂවත් ආකාරයෙන් වර්ණනා කිරීම මෙහිදි දැකිය හැකිය. ලෞකිකත්වය කෙරෙහි දැඩි ආශාවක් ඇතිවන ආකාරයෙන් සම්පාදනය කරන ලද දේශනාවකි. ලෞකිකත්වය ප්‍රතික්ෂේප කොට ප්‍රතිපත්තියට මුල් තැන දුන් යුගයක මෙවැනි සූත්‍ර රචනා වීම විශ්මය ජනකය. ඉන් අනතුරුව එන ජනවසභ සූත්‍රයේ දී සම්බුද්ධ සාසනයෙහි බඹසර රැකීමේ

අනුසස් හා ඡන්ද, චිත්ත, විරිය, විමංසා යන සතර සතිපට්ඨානයන් හා සමාධිය වඩා ගැනීමේ දී උපකාරී වන ධර්ම කරුණු මෙහි දක්වා ඇත.

මහාවග්ගයේ එන මහාගෝවින්ද සූත්‍රයේ දී බුදුරජුන් හා පංචසිඛ ගාන්ධර්වයා අතර ඇති වූ සංවාදයක දී සක්දෙවියන් විසින් බුදුරජාණන් වහන්සේගේ ගුණ වර්ණනා කිරීම බ්‍රහ්ම චරියවාසයෙහි අගය කියා දීම ආදිය ඇතුළත් වී ඇත. බෞද්ධ මාර සංකල්පය පිළිබඳ වැදගත් අදහසක් මහා සමය සූත්‍රයේ අන්තර්ගත වී ඇත. කිමුල්වත්පුර මහා වනයට බුදුන් වහන්සේ හා සිවුවනක් පිරිස පැමිණීමත් එතැනට පැමිණි මාර සේනාව පරාජිතව පසු බැස ගිය ආකාරයත් එහි විස්තර වේ. සූත්‍රය තුළ බුදුන් වහන්සේට හා මහා සංඝ රත්නයට ගෞරව කිරීම පිණිස ඒකරාශි වූ දෙවිවරුන්ගේ නාම ලේඛනයක් ඉදිරිපත් කර ඇත. එහි එන නම් අතර කුටෙන්ඩු වේටෙණ්ඩු විටුච්ච විටුඩ යන නම් වෙයි. මෙම නම් ආර්ය නම් යැයි සැලකිය නොහැකිය. ඒ අනුව මෙම සූත්‍රයේද පසුකාලීනව එකතු වූ කරුණු අන්තර්ගත වී ඇතැයි සිතිය හැකිය.

ශක්‍ර දේවේන්ද්‍රයා විසින් බුදුරජාණන් වහන්සේගෙන් විමසන ලද ප්‍රශ්න පිළිබඳ තොරතුරු සක්කපඤ්ඤ සූත්‍රයේ ඇතුළත් වේ. සක්දෙව් රජ සෝවාන් වීම පිළිබඳව ද මෙහි දී කරුණු දක්වා ඇත. දීඝ නිකායේ පමණක් නොව සමස්ථ ත්‍රිපිටකයේම එන ඉතා රමණීය ප්‍රේම වෘතාන්තයක් මෙම සූත්‍රයේ අන්තර්ගත වෙයි. ප්‍රේමය වැනි ලෞකික දේ කෙරෙහි බෞද්ධයා නැඹුරු වීම සාමාන්‍ය මිනිස් ස්වභාවයක් වුවද මුල්කාලීන බුදු සමය තුළ ප්‍රේම කතා ඇතුළත් වීමද විශ්වසනීයත්වයෙන් තොර වූවකි.

බෞද්ධ භාවනා ක්‍රම පිළිබඳව ද කරුණු ඇතුළත් වන්නේ මහාසතිපට්ඨාන සූත්‍රයේ ය. එහි දී ආනාපාන, චතු ඉරියාපථ, චතු සම්පජඤ්ඤ. පටික්කූලමනසිකාර, චතු ධාතුවවත්ථාන, නව සීවථික, නීවරණ, ඛන්ධ, ආයතන, බොජ්ඣංග ආදී කමටහන් විසි එකක් ඇතුළත් වේ. මෙම සූත්‍රයට සමාන දේශනාවක් මේ නමින්ම මජ්ඣිම නිකායේ ද ඇතුළත් වෙයි. එයට වඩා තරමක් දීර්ඝව මෙම සූත්‍රය සංවර්ධනය වී ඇති ආකාරයක් දැකිය හැකිය.



මහාවග්ගයේ අවසාන සූත්‍රයේ දී එනම්, පායාසි රාජඤ්ඤ සූත්‍රයේ දී පායාසි නම් බමුණා තුළ තිබූ වැරදි දෘෂ්ටි දහයක් කුමාර කස්සප හිමියන් විසින් ප්‍රතික්ෂේප කරන අයුරු දැකිය හැකිය. මෙම සූත්‍රය සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව රචනා වූ බව පැවසෙයි. බෞද්ධ භික්ෂූන් වහන්සෙලා තුළ තිබූ වාදයෙහි නිපුණබව මැනවින් කියාපාන සූත්‍රයකි.

දීඝනිකායේ තුන්වන වග්ගය වන්නේ පාථික වග්ගයයි. එම වග්ගය ආරම්භ වන්නේ ද පාථික සූත්‍රයෙනි. බුදුන්වහන්සේ තුළ පැවති ආගමික සහනශීලීත්වය මෙමගින් ඔප්නැංවී ඇත. උන්වහන්සේ භාර්ගව නම් පිරිවැජියාගේ ආරාමයට වැඩම කිරීම හා බුදුන්වහන්සේ කෝරක්ඛත්තිය බමුණා හා සුනක්ඛත්ත ලිච්ඡවී පුත්‍රයා අතර ඇති වු සංවාදය එහි ඇතුළත් වේ. බුදුන් වහන්සේ ඍධි ප්‍රාතිහාර්ය දැක්වීම ප්‍රතික්ෂේප කරන ශාස්තෲන් වහන්සේ නමක් ලෙස ප්‍රසිද්ධ වුවද මෙහිදී දක්වන්නේ තමන් වහන්සේ ඍධි ප්‍රාතිහාර්ය දක්වද්දීම සුනක්ඛත්ත බුදු දහම අතහැර ගිය බවයි. **"එවම්පි ඛො මං ත්වං මෝඝපුරිස උත්තරී මනුස්ස ධම්මා ඉද්ධිපාටිහාරියං කරොන්තං එවං වදෙසි. නහි පන මෙ භන්තේ භගවා උත්තරී මනුස්ස ධම්මා ඉද්ධිපාටිහාරියං කරොතීති."**[17]

ප්‍රාතිහාර්ය දැක්වීමෙන් තමා ජනයා නම්මවා නොගන්නා බව ප්‍රකාශ කරන බුදුන් වහන්සේ මෙවැනි ප්‍රකාශයක් සිදු කළේද යන්න සැක සහිතය. මෙම කොටස් පසුකාලීනව එකතු වන්නට ඇතැයි සිතීම වරදක් නොවේ. පාටික පුත්‍ර සුනක්ඛත්ත නිවට බිය සුල්ලෙකු ලෙස පෙන්වීම සූත්‍ර රචනයේ අරමුණ බව පැහැදිලි වෙයි. ඒ අනුව මෙම සූත්‍රය ද පසුකාලීන බව පෙනෙයි.

මෙහි එන වැදගත් සූත්‍රයක් වන්නේ උදුම්බරික සීහනාද සූත්‍රයයි. බුදුන් වහන්සේ ධර්ම දේශනා කරන්නේ අන්‍ය ශ්‍රාවකයන් තම ශ්‍රාවකයන් බවට පත්කරවීම සඳහා නොවන බව ද එහි දක්වා ඇත. දස සක්විතිවත් හා පන්සිල් රැකීමේ අනුසස් ද, රටක අපරාධ පැතිරීමට බලපාන හේතු සාධක ද ඇතුළත් සූත්‍රයකි, චක්කවත්තී සීහනාද සූත්‍රය. සදාචාරය පිරිහෙන ආකාරය ද එය නැවත සකස් කරගන්නා ආකාරය ද එහි දක්වා ඇත.

වාසෙට්ඨ හා භාරද්වාජ යන ශ්‍රමණවරුන් දෙදෙනා හා බුදුරජාණන් වහන්සේ අතර ඇති වූ සංවාදය අග්ගඤ්ඤ සූත්‍රයේ දී විග්‍රහ කරයි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යන වර්ණයන් ඇති වීමට හේතූන් ද, කුමන වර්ණයකට අයත් වුව ද යහපත් අය සුගතිගාමී වන බවත්, අයහපත් අය දුගතිගාමී වන බවත් මෙහි දක්වා ඇත. අග්ගඤ්ඤ සූත්‍රයෙන් පසුව ඇත්තේ සැරියුත් තෙරුන් විසින් දේශනා කරන ලද සම්පසාදිනී සූත්‍රයයි. එහි දී බුදුරජාණන් වහන්සේට තමන් තුළ ඇති ගෞරවය ඇති වූයේ කෙසේ ද යන්න විග්‍රහ කරයි. එබඳු ආකාරයේම සූත්‍රයකි, පාසාදික සූත්‍රය. ත්‍රිවිධ රත්නයේ ගුණ මෙහි ඇතුළත් වන අතර විවිධ දෘෂ්ටිවාද දුරු කරන අයුරු ද එහි දී පෙන්වා දී ඇත.

දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඇතුළත් වී ඇති සූත්‍රයකි, ලක්ඛණ සූත්‍රය. එම ලක්ෂණ ඇති අය ගිහිගෙයෙහි වාසය කළහොත් සක්විති රජ වන බවත්, පැවිදි වුවහොත් බුදු වන බවත් එහි දී දක්වා ඇත. එසේම එම ලක්ෂණයන් ඇති වීමට බලපෑ හේතු සාධක ද එහි දී විස්තර කර ඇත. බුදුන් වහන්සේ අතිමානුෂීත්වයට පත් කරන ස්වභාවයක් මෙහි දී දැකිය හැකිය.

සාමාජීය වශයෙන් ඉතාම වැදගත් සූත්‍රයක් වන සිඟාලෝවාද සූත්‍රය ඇතුළත් වන්නේ ද මෙහි ය. සිඟාලකගේ සදිසා නමස්කාරය ආදිය එහි දී මැනවින් විස්තර කර ඇත. සිව්වරම් දෙවිවරු තම පිරිවර ද කැටුව බුදුන් වෙත පැමිණ දේශනා කරන ලද සූත්‍රයකි, ආටානාටිය සූත්‍රය. බෞද්ධ ආරක්ෂක මන්ත්‍රයක් ලෙස ද භාවිත වන මෙය බුදුන් වහන්සේ විසින් අනුදන්නා ලද්දක් බව කියවේ. තන්ත්‍ර සාහිත්‍යයේ දියුණු යුගයක මෙම සූත්‍රය රචනා වන්නට ඇතැයි සිතිය හැකිය. මුල් බුදු සමයේ පිරිත් ලෙස හඳුනාගත් සූත්‍රවලට වඩා හාත්පසින්ම වෙනස් වූ දේශනාවක් ලෙස ආටානාටිය සූත්‍රය හැඳින්විය හැකිය. මහායාන බුදු සමයේ ද පරිහානිකර යුගයක මෙම සූත්‍රය දීඝ නිකායට එකතු වන්නට ඇතැයි අනුමාන කළ හැකිය.

අගසව් සැරියුත් තෙරුන් විසින් දේශනා කරන ලද සූත්‍රයකි, සංගීති සූත්‍රය. මෙහි අංක එකේ සිට දහය තෙක් බුද්ධ දේශනාව



ගොනු කර ඇත. එයට සමානම සූත්‍රයකි, දසුත්තර සූත්‍රය. එය ද සැරියුත් තෙරුන්ගේ ය. මෙහි දී ධර්මය දහයේ කොටස් දහයකට බෙදා දක්වා ඇත. අනාගත සංගීති කාරක තෙරවරුන්ට මූලික ආදර්ශයක් වශයෙන් දේශනා කර ඇති සූත්‍රයකි. අංගුත්තර නිකායේ මූලික ස්වරූපය මෙහි ඇතුළත් වී තිබේ.

## සමාලෝචනය

ධර්මමය කරුණු මෙන්ම බුද්ධකාලීන ඉන්දියාවේ ආගමික සාමාජික හා ආර්ථික තොරතුරු ද අධ්‍යයනය කිරීම සඳහා දීඝනිකාය බෙහෙවින් උපකාරී වේ. විවිධාකාරයේ සමාජ හා පෞද්ගලික අර්බුදයන්ට ආගමික නායකයන්ගෙන් ලැබුණ ආධානග්‍රාහී පිළිතුරු හා ඒවා විවේචනය කරමින් නව දෘෂ්ටිකෝණයකින් බුදුරජාණන් වහන්සේ ප්‍රශ්න විග්‍රහ කර ඇති බව ද මෙහි දී අධ්‍යයනය කළ හැකිය.

දීඝනිකායේ වර්ග තුනට ම අයත් සූත්‍ර තිස් හතරෙහිම අන්තර්ගත කරුණු සියුම් ව පරීක්ෂා කර බැලීමේදී මැනවින් පැහැදිලි වන්නේ එම ග්‍රන්ථය එක් යුගයකදී පමණක් සම්පූර්ණ වූවක් නොවන බවයි. විවිධ යුගවලදී අනාධිමත් කාලයක් තුළ ගොඩ නැගී වර්තමානයේ අප ව්‍යවහාර කරන තත්වයට පත්වී ඇති ග්‍රන්ථයක් බව පැහැදිලි වෙයි.

## ආන්තික සටහන්

1. සුමංගලවිලාසිනී, හේවාවිතාරණ මුද්‍රණය, 14 පිටුව
2. සමන්තපාසාදිකාව, හේවාවිතාරණ මුද්‍රණය, 09 පිටුව
3. චුල්ලවග්ග පාලි බු.ජ.ත්‍රි.මු, 391 පිටුව
4. සමන්තපාසාදිකා, හේවා විතාරණ මුද්‍රණය, 16 පිටුව
5. අපදානපාලි, ත්‍රි.බු.ජ.මු., 44 පිටුව
6. දීඝනිකාය, මහා පරිනිබ්බාණ සූත්‍රය, ත්‍රි.බු.ජ.මු., 117 පිටුව

7 . සුමංගලවිලාසිනී. හේවා විතාරණ මුද්‍රණය, 14 පිටුව
8 . සුමංගලවිලාසිනී, හේවා විතාරණ මුද්‍රණය. 07 පිටුව
9. ධාරා ශාස්ත්‍රීය සංග්‍රහය, II කාණ්ඩය, II කලාපය, උදය මුද්‍රණාලය, කැලණිය, 1963, 17 පිටුව
10. Muller, Max, Pali Literature and Language, Kolkota, 1943 62p
11 . Ibid, 17p
12. පී, වී, බාපට් ''දීඝනිකාය එක් යුගයකට අයත් කෘතියක් ද?'' ධාරා ශාස්ත්‍රීය සංග්‍රහය, II කාණ්ඩය, II කලාපය, උදය මුද්‍රණාලය, කැලණිය, 1963, 28 පිටුව
13. සිංහල දීඝ නිකාය, සූත්‍ර පිටක ග්‍රන්ථමාලා - I, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 1996, පෙරවදන
14. පී, වී, බාපට් ''දීඝනිකාය එක් යුගයකට අයත් කෘතියක් ද?'' ධාරා ශාස්ත්‍රීය සංග්‍රහය, II කාණ්ඩය, II කලාපය, උදය මුද්‍රණාලය, කැලණිය, 1963, 28 පිටුව
15. සිංහල දීඝ නිකාය, සූත්‍ර පිටක ග්‍රන්ථ මාලා - I, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 1996, 124 පිටුව
16. පී,.වී, බාපට් ''දීඝනිකාය එක් යුගයකට අයත් කෘතියක් ද?''ධාරා ශාස්ත්‍රීය සංග්‍රහය, II කාණ්ඩය, II කලාපය, උදය මුද්‍රණාලය, කැලණිය, 1963, 36 පිටුව
17. දීඝනිකාය, පාථික වග්ගය, පාථික සූත්‍රය, ත්‍රි. බු. ජ. මු. 24 පිටුව